රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකඃ 258.

ආයතන අංශය,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1984 ජූනි මස 27 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත.

## 1983 ජූලි මාසයේ ඇති වූ කලබල නිසා සිය නිවෙස් අහිමි වී තවමත් නිවසක් නොමැතිව සිටින රජයේ නිලධරයන් පිළිබඳ තොරතුරු

1983 ජූලි මාසයේ ඇති වූ කලබල හේතුකොට ගෙන තමන් පදිංචිව සිටි නිවාස අහිමි වී තවමත් නිවසක් නොමැතිව සිටින රජයේ නිලධරයන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට අවශ්‍යය. එම නිසා කරුණාකර එවැනි එක් එක් නිලධරයා පිළිබඳ පහත සඳහන් තොරතුරු ලබාගෙන ඔබ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වෙන් වෙන්ව දක්වමින්, මුළු අමාත්‍යාංශයටම එක ලැයිස්තුවක් වන සේ සකස් කොට 1984 ජූලි 31 වන දිනට පෙර මා වෙත එවන්න.

I. නිලධරයාගේ නම සහ තනතුර.
II. 1983 ජූලි කලබල ඇති වන විට සේවය කළ සේවා ස්ථානයේ ලිපිනය.
III. ඒ වන විට පදිංචිව සිටි ස්ථානයේ ලිපිනය.
IV. පදිංචිව සිටි නිවාසය තමන්ට අයිති නිවාසයක්/කුලියට හෝ බද්දට ගත් නිවාසයක්/ රජයේ නිවාසයක්/ කුලියට පින්තවිලේ ක්‍රමයට ලබාගත් නිවාසයක්ද යන වග.

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

..........2/-